## දෙවිනුවර දේවාලය



මාතර නගරයේ සිට තංගල්ල පාරේ මාතර සිට 4km දුරින් පිහිටා ඇත.

දප්පුල රජතුමා විසින් ඉදිකරන ලදි.ක්‍රි.ව 8 වන සියවසේ කිහිරැලි පිරිවෙන නමින් ආරාමික ආයතනයක් පැවත ඇත.ශිලා ලේඛනයට අනුව විජයබාහු රජතුමා මෙම ස්ථානයේ පැවති විහාරයක් සංරක්ෂණය කර ඇත.

## දෙවිනුවර ගල්ගෙය

දෙවිනුවර රජ මහා විහාරයේ උපුල්වන් දේවාලයට මීටර් 500 ක් දුරින් පිහිටා ඇත.



මෙහි ඇති විහාරය සහ දේවාලය කළු ගලෙන් තනා ඇත.ක්‍රි.ව. 1947 දී සංරක්ෂණය කරන ලදි.සෙනරත් පරණවිතාන මහතා අදහස් කරන්නේ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් 15 වන සියවසේ දී ලිඛිත පරෙවි සංදේශයේ දක්වෙන ගනේෂ දේවාලය මෙය විය හැකි බවයි.ආයතචතුරශ්‍රකාර ගොඩනැගිල්ල ගල් දොරකින් යුක්තය.දෙපස කොරවක් ගල්වලින් සරසා ඇත.

## මිරිස්ස සමුද්‍රගිරි විහාරය



මාතර -ගාල්ල මාර්ගයේ මාතර සිට 10km දුරින් මිරිස්ස රෝහල අසල පිහිටා ඇති ඉපැරණි

මහනුවර පහතරට සම්ප්‍රදායට අයත් චිත්‍ර සහිත විහාරයකි. පැරණි ඉංග්‍රිසි ගෘහ නිර්මාණ ලක්ෂණ රාශියක් දකගත හැකිය. සංචාරක ආකර්ශනය දිනාගත් වෙරළ තීරයක් විහාරය අසල වේ.

## මාතර තාරකා කොටුව

මාතර නගරයේ සිට ගාල්ල දෙසට 300m දුරින් මාතර මූලික රෝහල ඉදිරිපිට පිහිටා ඇත.



ලන්දේසින් විසින් ආරක්ෂාව සඳහා ඉදිකරන ලදි..තාරකාවක් හැඩයෙන් නිර්මාණය කර ඇත.ක්‍රි.ව. 1763 දී ඉදිකිරීම් ආරම්භ කොට ක්‍රි.ව.1765 කටයුතු නිමකරන ලදි.උඩරට ආක්‍රමණය කළ බාරෝස් වැන් එක් නැමැති ලන්දේසි ආණ්ඩුකාරවරයා ලන්දේසි බට කණ්ඩායම් රඳවා තබා ගැනීමට මෙම ස්ථානය භාවිත කරන ලදි.

## ගන්දර පුරාණ විහාරය



මාතර නගරයේ සිට තංගල්ල පාරේ මාතර සිට 4km දුරින් පිහිටා ඇත.

මහනුවර යුගයට අයත් සිතුවම් සහිතය. මහනුවර යුගයට අයත් සිතුවම් රාශියක් ඇත (භික්ෂු රූප, නෙලුම් මල් මෝස්තර, ලියවැල්). විචිත්‍ර මකර තොරණක 'බුද්ධ මන්දිරයේ පිටුපසින් නිර්මාණය කරන ලද කතරගම දේව ප්‍රතිමාවක් හා විශ්ණුදේවප්‍රතිමාවක් මෙන්ම අඹනලද අටවිසි බුදුවරුන්ගේ හිටි බුද්ධ ප්‍රතිමා රැසක් ද දැකගත හැකි වේ.

## උමංගල රජමහා විහාරය

හක්මන බෙලිඅ-ත්තපාරේ හක්මන සිට 5km දුරින් පිහිටා ඇත.



මහනුවර යුගයට අයත් චිත්‍ර සහිත ලෙන් විහාරයකි. පැරණි වෘත්තාන්ත අනුව උමංගල නම හට ගෙන ඇත්තේ මෙම විහාරය හා ඊට සැතපුම් හතරක් ඈතින් පිහිටි මුල්ගිරිගල උමගකින් සම්බන්ධ වී ඇති නිසාය.

## වෙහෙරහේන රජමහා විහාරය



මාතර නගරයේ සිට යටියන මාර්ගයේ මාතර සිට 06km දුරින් පිහිටා ඇත.

මහනුවර යුගයට අයත් චිත්‍ර සහිත විහාරයකි.

## ගැටබරු රජමහා විහාරය

අකුරැස්ස දෙනියාය මාර්ගයේ කොටපොළ නගරයේ පිහිටි ඉපැරණි ලෙන් විහාරයකි.



මහනුවර යුගයට අයත් චිත්‍ර සහිත විහාරයකි. රජ්ජුරු බණ්ඩාර දෙවියන්ගේ දේවාලයක් සහිතය.

## විලයාය පුරාණ විහාරය

මාතර ඌරුබොක්ක පාරේ දම්පහල හන්දියේ සිට 3km දුරින් පිහිටි ඉපැරණි ටැම්පිට විහාරයකි. මෙය ඓතිහාසික පුරාණ විහාරයකි.



ධීවර කර්මාන්තය

රිටිපන්නය

මෙය සාම්ප්‍රදායික ධීවර කර්මාන්තයට අයත් සුවිශේෂි වූ මසුන් ඇල්ලීමේ අංගයකි. වර්තමානය වන විට මෙහි නියලෙන පිරිස ක්‍රමයෙන් අඩුවෙමින් පවති.